# බදාදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 50 : 4-9

**මට නින්දා කරන්නන්ගෙන් මගේ මුහුණ හරවා නොගතිමි.**

විඩාවට පත් වුවන් ශක්තිමත් කරන පිණිස ගුරුවරයෙකු මෙන් මා කිව යුතු දේ ගැන සිසුවෙකු මෙන් එතුමන්ට සවන් දෙන පිණිස, මහෝත්තම දෙවි සමිඳාණෝ හැම උදයකම මා තුළ උනන්දුවක් ඇති කරවන සේක. දෙවි සමිඳුන් මාගේ කන් පහදා ඇත. මා එතුමන්ට විරුද්ධව කැරලි ගැසුවේවත්, එතුමන්ට පිටුපා ගියේවත් නැත. මට පහර දෙන්නන්ට මම මගේ පිට පෑවෙමි. මාගේ රැවුල් ගස් උදුරන්නන්ට මම මුහුණ දුන්නෙමි. මාගේ මුහුණ නින්දාවෙනුත්, කෙළ ගැසීමෙනුත් හරවා නොගතිමි. මහෝත්තම දෙවි සමිඳාණන් මට උපකාර කරන බැවින් මම වියවුල් නොවන්නෙමි. මම නිර්භීත ලෙස මුහුණ පාන්නෙමි. මා ලජ්ජාවට නොපැමිණෙන බව දනිමි. මන්ද දෙවිඳාණෝ මා ළඟ ය. එතුමාණෝ මා නිදොස් බව පෙන්වන සේක. මට විරුද්ධව චෝදනා කරන්නේ කවරෙක් ද? අපි දෙදෙනාම විනිශ්චයට යමු. ඔහු මට විරුද්ධව චෝදනාව ඉදිරිපත් කරාවා

මහෝත්තම දෙවි සමිඳාණෝ මට උපකාර කරන සේක. ‘මා වැරදිකරු ය’ යි ඔප්පු කළ හැක්කේ කවරෙකුට ද? කාවුන් කා දමන පරණ වස්ත්‍රයක් මෙන් මාගේ විරුද්ධකාරයෝ සියලු දෙනම අතුරුදහන් වන්නෝ ය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 69: 7-9, 20-21, 30, 32-33

පිළිතුර: අහෝ සමිඳුනි, ඔබේ අධික ප්‍රේමයෙන් මට සවන් දුන මැනව.

ගීය:

ඔබතුමන් උදෙසා මම අපවාදයට ලක් වුණෙමි. මාගේ මුහුණ ඒ ලැජ්ජාවෙන් වැසී ඇත්තේ ය. මාගේ සොයුරන්ට මම නාඳුනන්නෙක් වීමි. මාගේ මවගේ පුත්‍රයන් හට මම විදේශිකයෙක් වීමි.
ඔබේ දෙව් මැඳුරට ඇති උද්යෝගය මා දවන්නේය. ඔබට නින්දා කරන්නන්ගේ නින්දා මා පිට පැටවී ඇත්තේය.

නින්දාව නිසා මාගේ සිත බිඳී ගොස් මම ශෝකයෙන් පිරී සිටිමි. සනසන්නෙකු සෙව්වෙමි. එවැන්නෙක් නොවීය. අස්වසන්නකු සෙව්වෙමි. කිසිවෙක් සම්බ නොවීය. සාගින්නේ දී ඔව්හු මට වහ දුන්නෝය. පිපාසයේදී ඔව්හු මට තිත්ත කාඩි බොන්න දුන්නෝය.

එවිට මම ගී ගයා දෙවිඳුන් පසසන්නෙමි. තුති ගී ගයමින් මම එතුමන් බොහෝ සේ පසසන්නෙමි.
පීඩිතයෝ මෙය දැක ප්‍රීති ප්‍රමෝද වන්නේය. දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝය. මන්ද සමිඳාණෝ දිළිඳුන් හට සවන් දෙන සේක. හිරගත වී සිටින තම සෙනඟ අත් නොහරින සේක.

## සාධුකාරය

ඔබගේ පියාණන් හට කීකරු වී මැරීමට ගෙන යන අහිංසක බැටළු පැටවෙකු මෙන් ඔබගේ කුරුසිය රැගෙන ගිය අපගේ රාජාණෙනි. ඔබට මංගල වේවා!

# සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය. 26 : 14 – 25

***මනුෂ්‍ය පුත්‍රයාණන් ගැන ශුද්ධ ලියවිල්ලෙහි ලියා ඇති ලෙසම සිදු වන්නේය. එහෙත් එතුමන් පාවා දෙන යමෙක් වේද, ඔහුට වන විපතක මහත.***

දොළොස් දෙනාගෙන් කෙනෙකු වූ ජුදාස් ඉස්කාරියොත් නායක පූජකයන් වෙත ගොස්, "ජේසුස් වහන්සේ ඔබට පාවා දුන්නොත් ඔබ මට දෙන්නේ කුමක්දැ"යි ඇසීය. ඔව්හු රිදී මිල තිහක් කිරා ඔහුට දුන්හ. එතැන් පටන් ඔහු උන් වහන්සේ පාවා දීමට සුදුසු අවස්ථාවක් සෙවීය.

නුමුහුන් පූප මංගල්‍යයේ දී පළමුවන දින ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතට අවුත්, "පාස්කු භෝජනය වළඳන පිණිස අප කොතැන පිළියෙළ කරනවාට ඔබ කැමැති දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ ද "ඔබ නගරයේ සිටින අසවල් මනුෂ්‍යයා වෙතට ගොස් "මාගේ නියමිත මොහොත ළංව ඇත. මාගේ ශ්‍රාවකයන් සමඟ ඔබේ නිවසේ දී පාස්කු භෝජනය පවත්වමි යි ගුරු දේවයන් වහන්සේ කියන සේකැ යි ඔහුට දන්වන්නැ" යි ඔහුට වදාළ සේක. ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ ඔවුන්ට අණ කළ ලෙස පාස්කු භෝජනය පිළියෙළ කළහ.

සවස් වූ කල උන් වහන්සේ ශ්‍රාවකයන් දොළොස් දෙනා සමඟ කෑමට හිඳගත් සේක. ඔවුන් කෑම කමින් සිටිය දී, උන් වහන්සේ කතා කොට, "සැබැවින්ම මම ඔබට කියමි. ඔබෙන් කෙනෙක් මා පාවා දෙන්නේය" යි වදාළ සේක. ඔව්හු අතිශයින් ශෝකව එකිනෙකා "ස්වාමිනි, ඒ මම දැ"යි අසන්නට පටන් ගත්හ. උන් වහන්සේ උත්තර දෙමින් "මා සමඟ එක පාත්‍රයේ අතලන තැනැත්තේ මා පාවා දෙන්නේය. මනුෂ්‍ය පුත්‍රයාණන් ගැන ශුද්ධ ලියවිල්ලේ ලියා තිබෙන ලෙසම ඔහු නියමිත ගමන යන්නේය. එහෙත් මනුෂ්‍ය පුත්‍රයාණන් පාවා දෙන යම් මනුෂ්‍යයෙක් වේද, ඔහුට වන විපතක මහත! ඒ මිනිසා නූපන්නේ නම් වඩා හොඳය" යි වදාළ සේක. උන් වහන්සේ පාවා දුන් ජුදාස් උත්තර දෙමින් "ගුරු දේවයිනි, ඒ මම දැ"යි ඇසීය. "වෙන කවුදැ" යි උන් වහන්සේ ඔහුට වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.